**04-02-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, මේ සංගම් යුගයේ දී, ඔබ නව අසහාය වූ ඥානය ලබයි. කෙනෙකුගේ චරිත කොටස තව කෙනෙක් හා සම විය නොහැකිය.

**ප්‍රශ්නය:** ආධ්‍යාත්මික රණ විරුවන් වන ඔබට මායා ජය ගැනීම සඳහා ලබා දී ඇති ක්‍රමය කුමක්ද?

**පිළිතුර:** ඕ ආධ්‍යාත්මික රණ විරුවනි, දිගටම ශ්‍රීමත් අනුගමනය කරන්න! ජීවාත්ම සත්ථා විඥානය ඇති කරගෙන පරම පියාව සිහි කරන්න! උදේ පාන්දරින්ම නැගිට ස්මෘතිය පුහුණු කළ විට මායා පරදමින් ඔබට ජයග්‍රහණය ලැබේ. වැරදි සහගත සිතිවිල්ලෙන් ඔබ ආරක්ෂා වනු ඇත. ස්මෘතිය නම් වූ මිහිරි ක්‍රමය ඔබව මායාව පරදන ජයග්‍රාහකයින් බවට පත් කරවනවා ඇත.

**ගීතය:** දෙවියන් සගයා වූ අයට කුණාටුවකට කළ හැක්කේ කුමක්ද?

ඕම් ශාන්ති. මේ ගීතය රචනා කර ඇත්තේ මනුෂ්‍යයින් විසිනි. කිසිවෙක් එහි කිසිඳු තේරුමක් නොදනී. භක්තිවන්තයින් පැසසුම් ගී සහ භක්ති ගී ගයන නමුත් ඔවුන් කිසිවක් තේරුම් නොගනී. ඔවුන් බොහෝ ප්‍රශස්ති ගී ගයති. ඔබ දරුවන් කිසිවෙකුට ප්‍රශස්ති ගී ගැයිය යුතු නැත. දරුවන් කෙදිනකවත් පියාණන් නොපසසයි. පියෙක් ඔහුගේ දරුවන් ගැන දන්නා අතර දරුවන්ද ඔහු බාබා බව දනී. දැන්, මෙය වූ කලී අසීමිත කාරණයකි. ඒ කොයි හැටි වුවත්, හැම කෙනෙක්ම අසීමිත පියා සිහි කරයි. දැනුදු ඔවුන් දිගටම ඔහුව සිහි කරයි. ඔවුන් දෙවියන්ට මෙසේ කියයි ඕ බාබා! ඔහුගේ නම ශිව බාබාය. අප ජීවාත්ම සත්තාවන් වන්නා සේම ශිව බාබා ද ජීවාත්ම සත්තාවකි. ඔහු පරමාත්මා වන අතර ඔහු උත්තරීතරය. අප ඔහුගේ දරුවන්ය. ඔහුව හඳුන්වන්නේ පරමාත්මා යනුවෙන්ය. ඔහුගේ නිවස කොහිද? උත්තරීතර දනව්වේය. සියලුම ජීවාත්ම සත්තාවන් එහි වෙසේ. ජීවාත්ම සත්තාවන් වූ කලී නළුවන්ය. ඔබ දන්නවා නාටකයක සියලු නළුවන් අනුපිළිවලින් බව. හැම කෙනෙක්ම ඔහුගේ චරිත කොටස අනුව වැටුපක් ලබයි. එහි වෙසෙන සියලු ජීවාත්ම සත්තාවන් නළුවන්ය. කොහොමනමුත්, හැම කෙනෙකුම ලබා ඇත්තේ අනුපිළිවලින් වූ චරිත කොටසයි. ආධ්‍යාත්මික පියා මෙහි සිට ආධ්‍යාත්මික ජීවයන් තුළ අවිනාශී කොටස් වාර්තාගත වී ඇති බව විස්තර කරයි. ජීවාත්ම සත්තාවන් දෙදෙනෙකුට එකම චරිත කොටස තිබිය නොහැකිය. හැම කෙනෙකුටම එක සමාන ශක්තිය නොතිබේ. ඔබ දන්නවා හොඳම චරිත කොටස් ලැබෙන්නේ රුද්‍රා මාලයේ, ශිවාගේ මාලයට අයිති වන අයටයි. නාටකයේ ඉතා හොඳ නළුවන්ට බොහෝ පැසසුම් ලැබේ. මිනිසුන් ඔවුන් බැලීමටම යයි. මෙහිදී මෙය අසීමිත නාටකයකි. මෙම අසීමිත නාටකයේ ඉහළින්ම ඇත්තේ එකම පරම පියාය. ඔබට කිව හැකියි ඔහු ඉහළම ඉහළ නළුවා, නිර්මාණකයා හා අධ්‍යක්ෂක ද කියා. අනෙක් සියලු නළුවන් සහ අධ්‍යක්ෂකවරුන් ආදිය සීමිතය. ඔවුන් ලබා ඇත්තේ ඔවුන්ගේ කුඩා චරිත කොටස්ය. චරිත කොටස රඟපානුයේ ජීවාත්ම සත්තාවයි. කොහොමනමුත්, ශරීර අවධානය නිසා, ඔවුන් කියන්නේ ඒ ඔහුගේ චරිත කොටස කියාය. පරම පියා මෙසේ කියයි මුළු චරිත කොටසම ඇත්තේ ජීවාත්ම සත්තාව තුළයි. ඔබ ජීවාත්ම සත්තා විඥානයට පත් විය යුතුය. සත් යුගයේ හැම කෙනෙක්ම ජීවාත්ම විඥානයෙන් සිටිනා බව පරම පියා විස්තර කර දී ඇත. ඔවුන් පරම පියාව නොදනී. මෙහි කලියුගයේ දී ඔවුන් ජීවාත්ම සත්තා විඥානය නැතුවා සේම පරම පියාවද නොදනී. ඔබ දැන් ජීවාත්ම සත්තා විඥානයට පැමිණෙමින් සිටින අතර පරම පියාවද දන්නා අයයි. ඔබ බ්‍රහ්මින්වරු ලබන්නේ අසහාය ඥානයකි. ඔබ ජීවාත්ම සත්තාව පිළිබඳව දන්නා අතර සියලු ජීවාත්ම සත්තාවන් නළුවන් වන්නේ කෙසේදැයි දනී. හැම කෙනෙක්ම ඔහුගේ චරිත කොටස රඟන අතර ජීවාත්ම සත්තා දෙකකට එක සමාන චරිත කොටස් නොලැබේ. ඔහුගේ මුළු චරිත කොටසම වර්තාගත වී ඇත්තේ ජීවාත්ම සත්තාව තුළය. ඇත්තෙන්ම, නාටකයක චරිත කොටස ලබන්නේ ජීවාත්ම සත්තාවයි. හොඳ චරිත කොටසක් ලබන්නේද ජීවාත්ම සත්තාවයි. ජීවාත්ම සත්තාවක් පවසන්නේ, ''මා ආණ්ඩුකාරයෙකි'' හෝ ''මා අහවලාය''. කොහොමනමුත්, ඔවුන් ජීවාත්ම සත්තා විඥානයට පත් නොවේ. සත් යුගයේ දී ඔවුන් තේරුම් ගෙන සිටිනවා ඔවුන් ජීවාත්ම සත්තා බවත් ඔවුන් එක ශරීරයක් අතහැර තව ශරීරයක් ගන්නා බවත්. එහිදී කිසිවෙක් පරමාත්ම දෙවියන් නොදනී. මෙකල ඔබ සියල්ල දනී. බ්‍රහ්මිණ්වරු වන ඔබ ක්ෂුද්‍රයින්ටත් දෙවි දේවතාවරුන්ටත් වඩා බොහෝ ඉහළය. මෙසේ බ්‍රහ්මින්වරු වන අය එන්නේ කොහි සිටද? ප්‍රදර්ශන වලට සිය දහස් ගණන් ආවත්, මෙම ඥානය ගෙන තේරුම් ගන්නා අය යටත් වැසියන් බවට පත් වේ. එක රජෙකුට බොහෝ යටත් වැසියන් ඇත. ඔබ බොහෝ වැසියන් බිහි කර ගනී. සමහරු මෙම ඥානය ප්‍රෙකෂ්පණ යන්ත්‍ර

වලින් සහ ප්‍රදර්ශන වලින් ලබා ගෙන බොහෝ හොඳ අය බවට පත් වේ. ඔවුන් සැම දෙයක්ම ඉගෙන ගන්නා අතර යෝගා ද ඇති කර ගනී. ඔවුන් දැන් දිගටම මතුවනු ඇත. යටත් වැසියන් සේම ධනවතුන්, රජුන් හා රැජිණියන් ද දුප්පත් අයද සියලු දෙනා මතුවේ. බොහෝ කුමාරවරුන් හා කුමරියන් ඇත. කුමාරවරුන් හා කුමරියන් නිර්මාණය විය යුත්තේ සත් යුගයට සහ ත්‍රේත යුගයටයි. ඔවුන් අටක් හෝ 108 ක් පමණක් නොවේ. සියලු දෙනා දැන් නිර්මාණය වෙමින් ඇත. ඔබ දිගටම සේවය කරයි. මෙයද අළුත් දෙයක් නොවේ. ඔබ පවත්වන උත්සව අළුත් දෙයක් නොවේ. ඔබ මෙය බොහෝ වාරයක් කර ඇත. ඔබ මේ ව්‍යාපාරය කරන්නේ මෙම සංගම් යුගයේ දී පමණයි. ඔබ තවත් වෙන මොනවද කරන්නේ? පරමාත්ම පියා පැමිණෙන්නේ අපිරිසිඳු අයව පවිත්‍ර කරවීමටයි. මෙය හඳුන්වන්නේ ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය කියාය. සියල්ල අනුපිළිවෙලිනි. හොඳ දේශන පවත්වන අය ගැන හැම කෙනෙක්ම කියන්නේ අහවලා ඉතා හොඳ දේශනයක් කළා කියාය. ඉන්පසු, ඔවුන් තව කෙනෙකුගේ හොඳ දේශනයකට සවන් දුන් විට, ඔවුන් කියන්නේ පළමු කෙනා හොඳින් විස්තර කළ බවයි. තුන්වැන්නෙකුට ඇහුම්කන් දුන් විට ඔවුන් කියන්නේ ''ඒ දෙන්නටම වඩා මෙයා හොඳයි'' කියාය. ඔබ අන් අයට වඩා ඉදිරියෙන් යාමට හැම කරුණක්ම අරඹයා උත්සාහ දැරිය යුතුය. දක්ෂ අය එසැනින්ම දේශන දීම සඳහා භාර ගනී. ඔබ සියලු දෙනා උත්සාහ කරන අයයි. ඔබ ඉදිරියට යන විට ඔබ තැපැල් දුම්රියන් (සීඝ්‍රගාමී දුම්රියන්) බවට පත් වේ. මමා විශේෂ තැපැල් දුම්රියක් විය. ඔබ බාබා ගැන දන්නේ නැත්තේ ඒ දෙදෙනාම එකට සිටින නිසාය. ඔබට කිව නොහැකියි කතා කරන්නේ කවුද කියා. ඔබ හැම විටම සැලකිය යුත්තේ ශිව බාබා විස්තර කරනවා කියාය. බාබාත් දාදාත් දන්නා නමුත් හැම කෙනෙක්ගෙම ඇතුළත දන්නේ එම කෙනාම පමණි. පිටතින්, ඔහු මෙසේ කියයි මොහු බොහෝ දක්ෂය. එම පැසසුම ඇසීම පියාට සුවයකි. කෙනෙකුගේ දරුවෙක් හොඳින් ඉගෙන ගෙන ඉහළ තත්ත්වයක් ලබන විට, ඔහුගේ පියා තේරුම් ගන්නවා ඔහුගේ පුතා ඔහුගේ නම බබලවන බව. කෙනෙකුට තේරුම් ගත හැකියි කුමන දරුවන්ද දක්ෂ කියා. දේශනයක දී ප්‍රධාන වන්නේ පරම පියාගේ පණිවුඩය විස්තර කර දීමයි. බාබා ඔබට උදාහරණ වශයෙන් දුන්නා දරුවන් පස් දෙනෙකුගේ පියෙකු ගැන. ඔහුට දරුවන් කීදෙනෙකු ඇත්දැයි ඇසූ විට ඔහු පිළිතුරු දුන්නේ දරුවන් දෙදෙනෙක් කියාය. එවිට අනෙකා ඇහුවා ඔබට දරුවන් පස් දෙනයි! කියා. එවිට ඔහු පිළිතුරු දුන්නා මෙසේ නමුත් මට ඉන්නේ වටිනා දරුවන් දෙදෙනයි! මෙහෙදීද එසේමයි. බොහෝ දරුවන් ඇත. පරම පියා මෙසේ කියයි මේ දූව වෛද්‍යා නිර්මලා, ඉතා හොඳයි. ඇය මේ කතාව ඉතා ආදරයෙන් ඇයගේ පියාට විස්තර කර ඇය වෙනුවෙන් මධ්‍යස්ථානයක් විවෘත කිරීමට හැකියාව ලබා ගත්තා. මේ වූකලී භාරත සේවයයි. ඔබ භාරතය දෙව්ලොවක් බවට පත් කරවමින් සිටිනවා. රාවණ් මෙම භාරතය අපායක් බවට පත් කරළා. එක සීතාවක් පමණක් නොවේ සිර ගත වී සිටින්නේ. ඔබ සියලු දෙනා රාවණ්ගේ සිර ගේ සිටිනා සීතාවන්ය. ඔවුන් බොහෝ ව්‍යාජ කතාන්තර ආගමික ලේඛණ වල ලියා ඇත. මේ භක්ති මාර්ගය නාටකයේ ද කොටසකි. ඔබ දන්නවා සත යුගයේ සිට පසු කරමින් ආ සියල්ල එලෙසම නැවත සිදු වන බව. ඔබ වන්දනාවට සුදුසු වී වන්දනා කරුවන් බවට පත් වේ. පරම පියා මෙසේ කියයි මට මෙහි පැමිණ වන්දනා කරුවන් බවේ සිට වන්දනාවට සුදුසු අය බවට වෙනස් කළ යුතුව ඇත. ඔබ පළමුව සත් යුගයට අයත්ව පසුව කලි යුගයට අයත් විය. සත් යුගයේදී එය සූර්ය වංශයේ ලක්ෂ්මී නාරායන රජ දහන විය. රාම රාජ්‍යය චන්ද්‍ර වංශයයි. මේ කාලයේ දී ඔබ සැම ආධ්‍යාත්මික රණ විරුවන්ය. යුධ පිටියට යන අය රණවිරුවන් යැයි කියැවේ. ඔබ ආධ්‍යාත්මික රණ විරුවන් වන අතර අන් අය භෞතික රණ විරුවන්ය. ඔවුන්ගේ සටන් භෞතික බලය මඟිනි. ආරම්භයේ දී තිබුණේ අත්වලින් කරන සටන්ය. ඔවුන් එකිනෙකා අතර සටන් කරන අතර එක්කෙනෙක් ජයග්‍රාහී වෙයි. දැන් ඔවුන් බෝම්බ ආදිය සාදා ඇත. ඔබ රණවිරුවන් වන අතර ඔවුන්ද රණ විරුවන්ය. ඔබ ශ්‍රීමත් පිළිපැදීමෙන් මායා පරදවා ජයගනී. ඔබ ආධ්‍යාත්මික රණ විරුවන්ය. ශරීර වල භෞතික ඉන්ද්‍රියන්ගෙන් කරන හැම එකක්ම කරන්නේ භූතාත්මයන්ය. පරම පියා පැමිණ භූතාත්මයන්ට මෙසේ උගන්වයි දරුවනි, මාව සිහි කළ විට මායා ඔබව විනාශ නොකරනු ඇත. ඔබේ පාප අළු වී යන අතර වැරදි සිතිවිලි නෙළයි. පරම පියා සිහිකිරීමෙන්, ඒ සතුටද ඇති වෙයි. මෙම නිසයි පරම පියා කියනුයේ හිමිදිරි පාන්දර මෙය මෙසේ පුහුණු කළ යුතු බව. බාබා, ඔබ ඉතා මිහිරියි! මෙසේ ''බාබා!'' කියන්නේ ජීවාත්ම සත්තාවන්ය. පරම පියා ඔබට හඳුන්වා දීම මෙසේ කර ඇත. මා ඔබේ පියාය. මා ආවේ ඔබට ලෝකයේ මුල, මැද, අග පිළිබඳ ඥානය කියා දීමටයි. මේ උඩුයටිකුරු මනුෂ්‍යා ලෝක වෘක්ෂයයි. මේ වූ කලී විවිධ ආගම් වලින් සැදි මනුෂ්‍යා ලෝකයයි. මෙය විවිධත්වයෙන් යුතු නාටකය යනුවෙන්ද හැඳින්වේ. පියා විස්තර කර දී තිබෙනවා ඔහු මිනිස් ගසේ බීජය බව. මිනිසුන් මාව සිහි කරනවා. කෙනෙක් එක ගසකට අයිති වන අතර තව කෙනෙක් වෙන ගසකට අයිතියි. ඔවුන් අනුපිළිවෙලින් දිගටම මතුවේ. මේ නාටකය පූර්ව නියමිතය. අහවලා එම ආගමේ නිර්මාතෘ ලෙස යැව්වා යැයි කියැවේ. කොහොමනමුත්, එහි සිට කිසිවෙක්

එවන්නේ නැත. මේ සියල්ල නාටකය අනුව නැවත සිදු වන දේය. අර කෙනා පමණයි ආගමක් සහ රජ දහනක් එකවර එකටම පිහිටුවන්නේ. ලෝකයේ කිසිවෙක් මෙය නොදනී. දැන් මේ ඇත්තේ සංගම් යුගයයි. විනාශයේ ගිණි දැල් මතු විය යුතුව ඇත. මේ වූ කලී ශිව බාබාගේ ඥාන යාග ගින්නයි. ඔවුන් එයට රුද්‍රා යන නම දී ඇත. ඔබ බ්‍රහ්මිණ්වරු නිර්මාණය කර ඇත්තේ ප්‍රජාපිතා බ්‍රහ්මා තුළිනි. ඔබ ඉහළම අයයි. අනෙක් සියලු පරම්පරාවල් පසුව මතු වේ. ඇත්තෙන්ම සියලු දෙනා බ්‍රහ්මාගේ දරුවන්ය. බ්‍රහ්මාට ආදී ආදීම මුතුන් මිත්තා යැයි ද කියයි. එය ප්‍රවේණි ගසයි. පළමුව ඉහළම බ්‍රහ්මා එන අතර ඉන් පසු ඉතිරි ප්‍රවේණි ගස වැවේ. දෙවියන් ලෝකය හදන්නේ කෙසේදැයි මිනිසුන් අසයි. නිර්මාණය ඇත. ඔවුන් අපිරිසිඳු වූ කළ ඔහුට (දෙවියන්) අඬගසයි. ඔහු පැමිණ අසතුටින් සිටින ලෝකයට සතුට ලබා දෙයි. මේ නිසයි මිනිසුන් මෙසේ අඬ ගසන්නේ ඕ දුකින් මුදවන්නාණනි, සතුට දානය කරන්නාණනි පැමිණෙන්න! ඔවුන් ඊට හරිද්වාර් යන නාමය දී ඇත. හරිද්වාර් යන්නෙහි තේරුම ''දෙවියන් කරා යන මාර්ගය'' යන්නයි. ගංගා නම් ගඟ ගලායයි. ඔවුන් විශ්වාස කරන්නේ ගංගා නම් ගඟෙහි ස්නානය කිරීමෙන් දෙවියන් කරා යන මාර්ගයට යා හැකි බවයි, නමුත් එවැනි, දෙවියන් කරා යන මාර්ගයක් කොහිද? මේ සඳහා ඔහු ක්‍රිෂ්ණා ගැන කියයි. මාර්ගය වන පරමාත්ම දෙවියන් නම් ශිව බාබාය. ඔහු දුකින් ගලවන්නා හා සතුට ලබා දෙන්නාද වෙයි. ඔබ පළමුව නිවස කරා යා යුතුයි. ඔබ දරුවන් දැන් දන්නවා ඔබේ පියා සහ නිවස ගැන. පරමාත්ම පියාගේ සිහසුන ඇත්තේ ටිකක් ඉහළිනි. මල් මාලාවක ප්‍රධාන මල මුලින් ඇති අතර ඊට පසුව ද්විත්ව ඇට අමුණා ඇත. ඉන්පසු ඔවුන් රුද්‍රා මල් මාලය ගැන කියයි. රුද්‍රා මල් මාලය ඉන්පසු විශ්නු මල් මාලය බවට පත් වෙයි. විශ්ණුට සමීප වන සේ ඔහුගේ බෙල්ල වටා එතෙන මල් මාලයේ අය විශ්නු දේශය පාලනය කරයි. බ්‍රහ්මිණ් මල් මාලය නිතර නිතර කැඩෙන නිසා ඒ ගැන නොකියැවේ. පියා මෙසේ විස්තර කරයි සියල්ල ඇත්තේ අනුපිළිවෙලිනි. අද ඔබ ඉතා හොඳින් සිටින අතර හෙට කුණාටුවක් හමා රාහු අල්ලා දුබල බවට පත් වේ. පරම පියා මෙසේ කියයි සමහර අය මට අයිතිව සිට මෙම ඥානය අසා පුදුම වී ඒ ගැන කතා කර ධ්‍යාන වලට පවා සමවැදී මල් මාලයටද අයිති වේ. ඉන්පසු, පිට වී ගොස් ඒ නිසාම සොහොන් පල්ලන් බවට පත් වේ. එසේ වීම නිසා, බ්‍රාහ්මණ මල් මාලයක් කෙසේ සාදන්නද? බ්‍රහමින් මල් මාලයක් සැදිය නොහැකි බව පරම පියා විස්තර කර දෙයි. භක්ති මල් මාලය රුද්‍ර මල් මාලයෙන් වෙනස් ය. භක්ති මල් මාලයේ, ස්ත්‍රීන් අතරින් මීරා ප්‍රධාන වන අතර පුරුෂයින් අතරින් නාරද් ප්‍රධාන වෙයි. මෙය වූ කලී රුද්‍රා මල් මාලයයි. පරමාත්ම පියා පැමිණ විමුක්තිය සහ ජීවන්මුක්තිය ලබා දෙන්නේ සංගම් යුගයේ දී පමණය. ඔබ දරුවන් දන්නවා ඔබ දෙව්ලොව හිමිකරුවන්ව සිටි බවත් දැන් එය අපාය බවත්. පරම පියා මෙසේ කියයි අපායට පයින් ගසා රාවණ් ඔබෙන් ඩැහැගත් දෙව්ලොව ආදිපත්‍යා හිමි කරගන්න. ඔබට මේ සියල්ල විස්තර කර දෙන්නේ පරම පියා පැමිණීමෙන් පසුය. ඔහු සියලු ආගමික ලේඛණ සහ වන්දනා ගමන් දනී. ඔහු බීජය ද ඥාන සාගරය ද, සාම සාගරය ද වෙයි. මෙසේ කියන්නේ ජීවාත්ම සත්තාවන්ය. පරම පියා විස්තර කර දෙනවා ලක්ෂ්මි හා නාරායන සත් යුග හිමිකරුවන් බව. ඔවුන්ට පෙර තිබුණේ කුමක්ද? නියතයෙන් ම එය කලියුගයේ අවසානයත්, ඒ සමඟම දෙව්ලොව බවට පත් වන සංගම් යුගයත් ඇත. පරම පියා දෙව්ලොව නිර්මාපකයා යැයි කියැවේ. දෙව්ලොව ස්ථාපනය කරන එකම කෙනා වන්නේ ඔහුය. ලක්ෂ්මි සහ නාරායන දෙව්ලොව හිමිකරුවන් විය. ඔවුන් උරුමය ලැබුවේ කාගෙන්ද? දෙව්ලොව නිර්මාපකයා වන පරම පියාගෙනි. මෙය වූ කලී පරම පියාගෙන් ලැබෙන උරුමයයි. ඔබ කාගෙන් හරි ඇසුවොත් ලක්ෂ්මි සහ නාරායන ඔවුන්ගේ සත් යුග රජ දහන ලැබුණේ කෙසේද කියා කිසිවෙකුට එය ඔබට කියා දීමේ හැකියාවක් නැත. මේ දාදා පවා මෙසේ කියයි මා මෙය දැන සිටියේ නැහැ. මම ඔවුන්ට වන්දනා කළා මිස කිසිවක් දැන සිටියේ නැහැ. පරම පියා දැන් මෙසේ විස්තර කර දී ඇත. ඔබ සංගම් යුගයේ දී රාජයෝගා ඉගෙන ගනී. ගීතාවේද රාජයෝගා ගැන සඳහන් වේ. ගීතාවේ මිස වෙන කොහෙවත් රාජයෝගා ගැන සඳහන් නොවේ. පරම පියා මෙසේ කියයි මම ඔබ රජවරුන්ගෙත් රජවරුන් ලෙස සදමි. පරමාත්ම දෙවියන් පැමිණ ඔබට ඥානය දී සාමාන්‍ය මනුෂ්‍යා බවින් නාරායන බවට වෙනස් කළා. භාරතයේ ප්‍රධාන ආගමික ලේඛණය ගීතාවයි. ගීතා නිර්මාණය වූයේ කොයි කලෙක දැයි කිසිවෙක් නොදනියි. මා එන්නේ චක්‍රයේ සංගම් යුගයේ දීය. රජදහන ලබා දුන් අය එය අහිමි කරගෙන තමෝ ප්‍රධාන් වී අසතුටින් ඇත. දැන් මෙය රාවණ් රාජ්‍යයයි. මේ මුළු භාරතයේ කතාන්තරයයි. භාරතය යනු සමස්ථයයි (එය සැම කල පවතී). අනෙක්වා සියල්ල පැමිණියේ පසුවය. පරම පියා මෙසේ කියයි මා ඔබට උපත් 84 රහස් කියා දෙයි. අවුරුදු 5000 කට පෙර ඔබ දෙව් දේවතාවන් විය. ඔබ ඔබලාගේ උපත්වත් දන්නේ නැත. ඕ භාරත වැසියනි, පරම පියා එන්නේ අවසානයේ දීය. ඔහු මුලින් පැමිණියා නම්, ඔහු මුල, මැද, අග ගැන ඥානය කියා දෙන්නේ කෙසේද? ලෝකයේ ජනගහනය මෙසේ වැඩි නොවූවා නම් ඔහු එය කෙසේ කියා දෙන්නද? සත් යුගයේ දී ඥානයේ අවශ්‍යතාවයක් නොමැත. වත්මන් සංගම් යුගයේදී පමණයි පරම පියා ඥානය ලබා දෙන්නේ. ඔහු වූ

කලී ඥානයෙන් පිරී එකම කෙනාය. ඔහු ඥානය කියා දීම සඳහා නියතයෙන්ම අවසානයේ දී පැමිණිය යුතුයි. ආරම්භයේ දී මොනවා කියා දෙන්නද? මේ කරුණු තේරුම් ගත යුතු ඒවාය. පරමාත්ම දෙවියන් කතා කරයි මා ඔබට රාජයෝගා උගන්වයි. මෙය වූ කලී පාණ්ඩව රජයේ විශ්ව විද්‍යාලයයි. දැන් මෙය සංගම් යුගයයි. ඔවුන් එක් තැන්ව වාඩි වී යාදව, කෞරව, පාණ්ඩව හමුදා පෙන්වා ඇත. පරම පියා මෙසේ විස්තර කරයි. කල්ප විනාශය සිදුවන වෙලාවේ දී යාදවයින් හා කෞරවයින්ට ඇත්තේ ස්නේහයෙන් තොර බුද්ධියයි. ඔවුන් එකිනෙකාට අපහාස කර ගනී. ඔවුන් වෙත පරම පියා කෙරෙහි කිසිඳු සෙනෙහසක් නැත. ඔවුන් කියන්නේ බල්ලන් බළලුන් අතරේ දෙවියන් සිටිනා බවයි. කොහොමනමුත්, පාණ්ඩවයින්ට ඇත්තේ ස්නේහයෙන් බර බුද්ධියයි. පාණ්ඩවයින්ගේ සගයා වන්නේ පරමාත්ම දෙවියන්මය. පාණ්ඩවයින් යනු ආධ්‍යාත්මික මාර්ග උපදේශකයින්ය. ඔවුන් භෞතික මාර්ග උපදේශකයින් වන අතර ඔබ ආධ්‍යාත්මික මාර්ග උපදේශකයින්ය. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණු දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ජීවාත්ම සත්‍ය විඥානයෙන් යුතුව මෙම අසීමිත නාටකයේ වීර චරිතය රඟපාන්න. හැම නළුවෙකුටම ඔහුගේම වූ චරිත කොටස ඇත. එමනිසා, වෙන කිසිවෙකුගේ චරිත කොටස සමඟ ඔබේ චරිත කොටස සංසන්දනය නොකරන්න.
2. උදේ පාන්දරින්ම අවදි වී ඔබටම කතා කරගන්න. භෞතික ඉන්ද්‍රියන්ගෙන් වෙන් වී සිටීම පුරුදු පුහුණු කරන්න. බාබා, ඔබ ඉතා මිහිරියි! ඔබ අපට ලෝකයේ මුල, මැද, අග ගැන ඥානය කියා දෙයි.

**වරදානය:** පියාගේ සංස්කාර ඔබේ මුල් සංස්කාර බවට පත් කිරීමෙන් ඔබ නිෂ්ඵල සිතිවිලි සහ පැරණි සංස්කාර වලින් නිදහස් වේවා.
සියලුම නිෂ්ඵල සිතිවිලි හෝ පැරණි සංස්කාර ශරීර අවධානයට සම්බන්ධයි. ජීවාත්ම අවධානයේ සංස්කාර පරම පියාගේ මෙන් වනු ඇත. පරමාත්ම පියා නිරන්තරයෙන් ලොවට යහපත සළසන්නා, සියලු දෙනාම ඉහළ නංවන කරුණාවන්ත ඒකායන තැනැත්තා සහ ආශිර්වාද පිරිනමන්නා වන්නා සේම, ඔබේ සංස්කාර ද ඒ ආකාරයෙන්ම ස්වභාවික වේවා. සංස්කාර නිර්මාණය කිරීම යනු ඔබේ සිතිවිලි, වචන සහ ක්‍රියා අනුව ක්‍රියා කිරීමයි. ඔබේ සංස්කාර ඔබේ ජීවිතයේ යතුර වන අතර එමගින් සියල්ල ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වේ. එවිට වෙහෙස වී වැඩ කිරීමට අවශ්‍ය නොවේ.

**පාඨය:** සැබෑ උත්සාහවන්තයින් තම ජීවාත්ම අවධාන අවධියේ ස්ථාවරව සිටින අතර ඔවුන්ගේ රථ (ශරීර) කාර්යය ඉටු කිරීමට සලස්වයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: එකමුතුකම සහ විශ්වාසයේ විශේෂත්වයෙන් සාර්ථකත්වයෙන් පිරිපුන් වන්න..**

පරමාත්ම පියා ඔබ සියලුම දෙනා සෑම කොනකින්ම සොයා ගත්හ. බොහෝ ගස් වල අතු දැන් එක් සඳුන් ගසක් බවට පත්ව ඇත. මිනිසුන් පවසන්නේ: කාන්තාවන් දෙදෙනෙකු හෝ හතර දෙනෙකු එකට ජීවත් විය නොහැකි බවයි. නමුත් ඔබ කාන්තාවන් දැන් ලෝකයේ සමගිය ස්ථාපිත කිරීමට උපකරණ වේ. ඔබ අතර මෙම එකමුතුකම පරම පියාගේ හෙළිදරව්ව ගෙන එනු ඇත.